# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 7
# දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1973 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ
අතිරේකයක් වශයෙන් පළකරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 7 දරන මුදල්
(සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 28 වන දින]

ඇල්. ඩි. —ඕ. 62/72.

1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 7 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. 1971 අංක 55 දරන පනතින් අන්තිම වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1963 අංක 11 දරන මුදල් පනතේ 159 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 1963 අංක 11 දරන, මුදල් පනතේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "මුදල් බලකරු" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"විදේශීය ව්‍යවහාර මුදල්" යන්නට විනිමය පාලන පනතෙහි එයට දී ඇති අර්ථය ම ඇත ;';

(2) "ඇමතිවරයා" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"නේවාසික නොවන" යන්නෙන් 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 54 වන වගන්තියේ අර්ථානුකූල ව ශ්‍රී ලංකාවේ නේවාසික ව නො සිටින බව අදහස් වේ ;';

(3) "ප්‍රමුඛ හවුල්කරු" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"සංචාරකයා" යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද ඔහු සම්බන්ධයෙන් ආගාමික හා විගාමික පනත යටතේ බලයලත් නිලධරයකු විසින් කරන ලද පිටසනක් දරන වලංගු ගමන් බලපත්‍රයක් හිමිව සිටින්නා වූ ද යම් තැනැත්තෙක් අදහස් වේ ;'; තවද

(4) "පිරිවැටුම" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"පිරිවැටුම" යන්නෙන්, යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් එය යෙදුණු විට, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් කරනු ලබන ගනුදෙනුවලින් හෝ ඒ ව්‍යාපාරය පවත්වා ගෙන යාමේදී ඉටු කරනු ලබන සේවාවලින් ලබා ගත් හෝ ලැබිය යුතු මුළු මුදල් ප්‍රමාණය අදහස් වන අතර එයට—

කේ 19462—9471 (73/3)

(අ) ධනයෝජකයකු, මුදල් ණයට දෙන්නෙකු හෝ බදු උකස් ගන්නකු සම්බන්ධයෙන් වූ විට ඔහු විසින් ණය වශයෙන් දෙන ලද මුදල්, ඒ ණය වෙනුවෙන් ඔහු විසින් ලබා ගත් හෝ ඔහුට ලැබිය යුතු පොළිය සහ ඒ ණය වෙනුවෙන් ගාස්තු හෝ වෙනත් අය කිරීම් වශයෙන් ඔහු විසින් ලබා ගත් මුදල් ;

(ආ) වෙන්දේසිකරුවකු සම්බන්ධයෙන් වූ විට, සහ (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව තැරැව්කරුවකු හෝ කොමිස් නියෝජිතයකු සම්බන්ධයෙන් වූ විට—

(i) ඔහු විසින් විකුණන ලද හෝ විකිණීමෙහි ලා ඔහු උපකාරක වූ ඉඩම් සම්බන්ධයෙන්, එම විකිණීම පිළිබඳව ඔහු විසින් සිදු කරවන ලද ගනුදෙනු හෝ ඉටු කරන ලද සේවාවන් සඳහා ඔහු විසින් ලබා ගත් හෝ ඔහුට ලැබිය යුතු කොමිස් මුදල් හෝ ගාස්තු ;

(ii) ඔහු විසින් විකුණන ලද හෝ විකිණීමෙහි ලා ඔහු උපකාරක වූ භාණ්ඩ කිසිවක් සම්බන්ධයෙන්, එම භාණ්ඩ ගැනුම්කරු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු සම්පූර්ණ මුදල ;

(ඇ) යම් තැරැව්කරුවකු (කොටස් තැරැව්කරුවකු හෝ පළදු තැරැව්කරුවකු හැර) හෝ කොමිස් නියෝජිතයකු—

(i) නේවාසික නොවන තැනැත්තකුගේ භාණ්ඩ කිසිවක් ඒ නේවාසික නොවන තැනැත්තා වෙනුවෙන් විකුණන්නා වූ හෝ විකිණීමෙහි ලා උපකාරක වන්නා වූ කල්හි ;

(ii) ශ්‍රී ලංකාවෙහි නිෂ්පාදිත යම් භාණ්ඩ කිසිවක් අපනයනය කරන්නකු වෙනුවෙන් ක්‍රියා කරන කල්හි ; හෝ

(iii) ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නා වූ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන්, ඒ ව්‍යාපාරය 120 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි " ව්‍යාපාරය " යන යෙදුමෙහි අර්ථානුකූල වූ ව්‍යාපාරයක් වුව ද නොවුව ද, විකිණීමෙන් ලැබෙන සම්පූර්ණ මුදල ඒ ව්‍යාපාරයෙහි පිරිවැටුමට ඇතුළත් වන භාණ්ඩ වූ ඒ තැනැත්තාගේ භාණ්ඩ කිසිවක් ශ්‍රී ලංකාවෙහි දී විකිණීමෙහි ලා උපකාරක වන්නා වූ කල්හි,

ඒ තැරැව්කරු හෝ කොමිස් නියෝජිතයා සම්බන්ධයෙන් වූ විට, එසේ විකිණීමෙහි හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමෙහි ලා හෝ එසේ විකිණීමෙහි දී උප කාරක වීමෙහි ලා ඔහු විසින් සිදු කරවන ලද ගනුදෙනු හෝ ඉටු කරන ලද සේවාවන් සම්බන්ධයෙන් ඒ තැරැව්කරු හෝ කොමිස් නියෝජිතයා විසින් ලබා ගත් හෝ ඔහුට ලැබිය යුතු කොමිස් මුදල් හෝ ගාස්තු, හා කොටස් තැරැව්කරුවකු හෝ පළදා තැරැව්කරුවකු සම්බන්ධයෙන් වූ විට, ඔහු විසින් සිදු කරවන ලද ගනුදෙනු හෝ ඉටු කරන ලද සේවාවන් සඳහා ඔහු විසින් ලබා ගත් හෝ ඔහුට ලැබිය යුතු කොමිස් මුදල් හෝ ගාස්තු ; සහ

(ඇ) යම් අධ්‍යාපනික ආයතනයක් හෝ පාසැලක් පවත්වා ගෙන යන තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට, අධ්‍යාපනික ආයතනයේ හෝ පාසැලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලබන ලාභ හැර එම අධ්‍යාපනික ආයතනය හෝ පාසැල පවත්වා ගෙන යාමෙන් ඔහු විසින් ලබා ගත් හෝ ඔහුට ලැබිය යුතු මුළු මුදල

ඇතුළත් වේ ; එහෙත් මේ පනතේ මේ කොටසෙහි අන් ආකාරයකින් ප්‍රකාශිත ව ම සඳහන් ව ඇතහොත් මිස, ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් මුදලක් ඇතුළත් නොවේ ;'.

3. මේ පනතින් ප්‍රධාන පනතේ 159 වන වගන්තියෙහි කරනු ලබන සංශෝධන 1971 දෙසැම්බර් 28 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. අතීතයට බලපෑම.